යම් පුවතක් වාර්තා කිරීමේදී, එය හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) ලෙසින් වාර්තා කිරීමේ ඇති ගැටළුව වන්නේ, එවිට පාඨකයා හට එම සිදුවීම අපක්ෂපාතීව ග්‍රහණය කරගැනීමට ඇති හැකියාව අහිමි වීම සහ එම සිදුවීමට අදාළ වන සියුම් කරුණු දෙස සමබර මනෝභාවයකින් යුතුව බැලීමට ඇති හැකියාව අහිමි වීමයි.

මෙය සිහියේ තබා ගනිමින්, මීගොඩ ප්‍රදේශයේදී අධික වේගයෙන් ධාවනය වූ බවට පැවසෙන මෝටර් රථයක්, ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වාහනයක ගැටී, පාර අසල සිටි කුඩා දරුවෙකු සහ පියා අනතුරට ලක්වීමත්, කුඩා දරුවා මිය යාමත්, බීමතින් සිටි බවට පැවසෙන රියැදුරු අත්අඩංගුවට පත්වීමත්, ස්වර්ණවාහිනී Live at 8 සහ හිරු නිව්ස් ප්‍රධාන පුවත් විකාශයන් ඔස්සේ වාර්තා වූ ආකාරය විමසා බැලිය හැක.

* ස්වර්ණවාහිනී සිරස්තලය: "බීමත් රියැරෙකුට මල් කැකුළක් බිලි වෙයි" (නිවේදක: "දීප්තිමත් අනාගතයක් මහ මඟදී මිලින වෙයි, බීමත් රියදුරා අත්අඩංගුවට")

* හිරු සිරස්තලය: "බීමත් රියදුරෝ කළ අනතුරින් පාසල් සිසුවෙක් මරුට" (නිවේදක: මීගොඩ ප්‍රදේශයේ මාර්ගය අසල සිටි දෙදෙනෙකු අනතුරට ලක් වූ ආකාරයයි")

1) මෙම ස්වර්ණවාහිනී පුවත තුළින්, ප්‍රේක්ෂකයාට මෙම සිදුවීම දෙස, කැළඹුණු හැඟීම් වලින් තොරව, අපක්ෂපාතීව බැලීමේ හැකියාවක් ලබාදෙන්නේ ද?

2) එසේ නම් ඔබ මෙම පුවත් විකාශයන් දෙක අතරින්, සිදුවීම සම්බන්ධයෙන් වඩාත් ම යෝග්‍ය ලෙසින් වාර්තා වී ඇති පුවත් විකාශය ලෙස තෝරා ගන්නේ කුමක්ද?

(YouTube වෙත එක් කොට තිබූ, ජුලි 27, 2023 දින ස්වර්ණවාහිනී Live at 8 සහ හිරු නිව්ස් රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයන් ඇසුරිණි.)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!